# තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

# ක්‍රීඩා වෛද්‍ය ආයතනය

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධ ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ පවතින විධායක සේවා ගණයේ (SL2) වෛද්‍ය නිලධාරි තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය - යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එහිදී ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

02. තනතුරේ ස්වභාවය - ස්ථිර විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය)

03. වැටුප් කේත අංකය - SL 2 – 2025

04. වැටුප් පරිමාණය - රු.91,750-3X2400-7X2420-2X2940-16X3900

- රු.184,170/- (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ට අනුව)

05. බඳවා ගන්නා ශ්‍රේණිය - II හා I ශ්‍රේණි

06. පුරප්පාඩු සංඛ්‍යාව - 04

07. සුදුසුකම් - ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවයේ II හෝ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම

08. වෘත්තීය සුදුසුකම් - අදාළ නොවේ

09. පළපුරුද්ද - අදාළ නොවේ

10. වයස් සීමාව - ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 25ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

11. **යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

| **ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 1.අතිරේක අධ්‍යාපන සුදුසුකම් (පරිශිෂ්ට අංක 01හි ඇතුළත් සුදුසුකම් පමණක් සලකා බැලේ) | 35 | අදාළ නොවේ |
| 2.අතිරේක වෘත්තීය සුදුසුකම් | 30 | |
| 3.ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ මූලික දැනුම පළපුරුද්ද | 25 | |
| 4.භාෂා ප්‍රවීණතාව | 05 | |
| 5.සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

**සටහන - පරිශිෂ්ට අංක 01**

| **විශේෂඥතාව** | **පිළිගත් සුදුසුකම්** |
|---|---|
| 1. ක්‍රීඩා වෛද්‍ය වේදය | ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව |
| 2. මූලික වෛද්‍ය විද්‍යාව | භෞතික වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව |
| 3. මානව පෝෂණය | මානව පෝෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය |
| 4. මනෝ වෛද්‍ය වේදය | මනෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව |

12. කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා 13. තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය

13. වෙනත් කරුණු -

13.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

13.2 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

13.3 සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි

13.4 අදාළ උපාධිය හෝ ඩිප්ලෝමාව බල පැවැත්වෙන දිනය අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පෙර දිනයක් විය යුතුය.

13.5 අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් දිනට අයදුම්කරුවන් විසින් සියළු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

14. අයදුම් කළ යුතු ක්‍රමය -

14.1 A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කර මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව (අංක 1 සිට 10 දක්වා පළමු පිටුවේද, අංක 11 සිට 13 දක්වා දෙවන පිටුවේද වනසේ) අයදුම්පත සකස් කර ගත යුතුය.

14.2 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන, රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු/ රු. 703,920/- ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

14.3 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 9X4 ප්‍රමාණයේ ලියුම් කවරයකට බහා එම කවරයෙහි ඉහළ වම් කෙළවරේ **"වෛද්‍ය නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය"** යනුවෙන් සඳහන් කර එම අයදුම්පත 2025 නොවැම්බර් 01 දින හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා වෛද්‍ය ආයතනය, නො.33, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**2025.09.29 දින**
**ක්‍රීඩා වෛද්‍ය ආයතනය,**
**නො. 33,**
**මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07.**

**වෛද්‍ය ජී.එල්.කේ.ඒකනායක**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ක්‍රීඩා වෛද්‍ය ආයතනය.**